**ඔපෙක් අරමුදලින් මූල්‍යයනය කරන බස්නාහිර පළාත් මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය - 2023**

----------------------------------------------------------------------------------------------------------------------

ඔපෙක් අරමුදලින් මූල්‍යයනය කරන බස්නාහිර පළාත් මාර්ග සංවර්ධන ව්‍යාපෘතියේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා කාලය

ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව, එවකට වරාය, නාවික කටයුතු හා මහා මාර්ග අමාත්‍යාංශය, වර්තමානයේ මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ශ්‍රී ලංකාවේ බස්නාහිර පළාතේ පෙර තෝරාගත් ජාතික මාර්ගවල කිලෝමීටර් 27 ක් වැඩිදියුණු කිරීම, සංවර්ධනය කිරීම හා පුළුල් කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. ණය ගිවිසුමට අනුව, **ව්‍යාපෘතියේ** ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 3,232.5කට සමාන එ.ජ.ඩො. මිලියන 24.87ක් වන අතර ඉන් රු.මිලියන 2,209.84කට සමාන එ.ජ.ඩො. මිලියන 17ක් සැපයීමට ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වූ ඔපෙක් අරමුදල විසින් එකඟවී තිබුණි. ව්‍යාපෘතිය එහි ඉදිකිරීම් කටයුතු 2017 ඔක්තෝබර් 05 දින ආරම්භ කරන ලද අතර 2019 ජූනි 28 දින වන විට නිමකිරීමට සැලසුම් කර තිබුණි. පසුව ව්‍යාපෘතියේ කටයුතු 2026 මැයි 10 දක්වා දීර්ඝ කර තිබුණි.

## 1.3 තත්ත්වාගණනය කළ මතය

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම යන කොටසේ විස්තර කර ඇති කරුණුවල බලපෑම හැර, 2023 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුදල් ප්‍රවාහය ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව පිළියෙල කිරීම, සත්‍ය හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය පරීක්ෂා කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක්

නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමුහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| අංකය | ගිණුම්කරණ අඩුපාඩුව/ විගණන නිරීක්ෂණය | මුදල රු. මිලියන | කළමනාකරණයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | මූල්‍ය ප්‍රකාශන සටහන් අංක 03 ට අනුව, බෙල්ලන - මොරගල මාර්ගයේ ඉදිකිරීම් අවසන් කර 2020 සැප්තැම්බර් 06 දින මාර්ග සංවර්ධන අධිකාරියට භාර දී ඇත. කෙසේ වෙතත්, වටිනාකම සිවිල් වැඩ සඳහා මාරු කර නොතිබූ අතර තවමත් කරමින් පවතින වැඩ ලෙස ගිණුම්ගත කර ඇත. එබැවින් සිවිල් වැඩ එම මුදලින් අඩුවෙන් දක්වා තිබුණි. | 1,293.72 | 2024 වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශනයේ එකී වටිනාකම සිවිල් වැඩ සඳහා පැවරීමට කටයුතු කරනු ලැබේ. | මූල්‍ය ප්‍රකාශන අත්සන් කිරීමට පෙර ගණකාධිකාරීවරයා SLPSAS සමඟ අනුකූල වන බවට සහතික විය යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | මූල්‍ය ප්‍රකාශනවලට අනුව කඩුවෙල සහ අගලවත්ත මාර්ග සඳහා ඉඩම් අත්පත් කර ගැනීමේ පොලී මුදල රුපියල් මිලියන 29.1 ගෙවිය යුතුය. කෙසේ වෙතත් 2024 වසරේ මුල් මාස දෙක තුළදී පෙර වසර සඳහා රුපියල් මිලියන 66.8 ක පොලියක් ගෙවා ඇත. ඒ අනුව මූල්‍ය ප්‍රකාශන මගින් ගෙවිය යුතු වන්දි මුදල රුපියල් මිලියන 37.7 කින් අඩුවෙන් දක්වා තිබුණි. | 37.7 | එකඟ වේ.<br>අතේ ඇති වවුචර මත පදනම්ව, මූල්‍ය ප්‍රකාශනවල පොලී මුදල උපචිතකර ඇත. ප්‍රායෝගිකව, ගෙවීම් සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් වවුචර ලැබෙන තෙක් නිශ්චිත සංඛ්‍යාව රැස්කර ගැනීම අභියෝගාත්මක ය. කෙසේ වෙතත්, නිවැරදි සංඛ්‍යාලේඛනයේ නිරවද්‍යතාවය සහතික කිරීමට අපි ඉදිරියේදී පියවර ගන්නෙමු. | මූල්‍ය ප්‍රකාශන අත්සන් කිරීමට පෙර ගණකාධිකාරීවරයා SLPSAS සමඟ අනුකූල වන බවට සහතික විය යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිය - 04 හි 18 වැනි වගන්තියට අනුව, වත්කම් අත්පත් කර ගැනීම, ඉදිකිරීම හෝ නිෂ්පාදනය කිරීම සඳහා සෘජුවම ආරෝපණය කළ හැකි ණය ගැනීමේ පිරිවැය එම වත්කම්වල පිරිවැයේ කොටසක් ලෙස ප්‍රාග්ධනිත කළ යුතුය. කෙසේ වෙතත්, 2023 දෙසැම්බර් 31 වන විට NSB ණයට අදාළ ණය ගැනීමේ පිරිවැය ව්‍යාපෘතිය විසින් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | 119.38 | එකඟ වේ.<br>මෙම ණය මුදල ලබාගෙන ඇත්තේ ව්‍යාපෘතිය නොව මාර්ග සංවර්ධන අධිකාරිය (RDA) විසිනි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, ණය ගැනීමේ පිරිවැය RDA හි වගකීමකි. ව්‍යාපෘතිය අවසන් කර RDA වෙත භාර දීමෙන් පසු, ඔවුන් ව්‍යාපෘතියේ පිරිවැය සහ ඒ ආශ්‍රිත ණය ගැනීමේ පිරිවැය ප්‍රාග්ධනය කරනු ඇත. එබැවින්, ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශයේ ප්‍රධාන ගණකාධිකාරීවරයාගේ අංක MT&H/HWY/ACC/18/2024/14 දරන සහ 2024පෙබරවාරි 05 දිනැති ලිපිය මගින් ලබා දී ඇති උපදෙස් අනුව ව්‍යාපෘතිය RDA වෙත භාර දෙන තෙක් ණය ගැනීමේ පිරිවැය ව්‍යාපෘතිය සිය මූල්‍ය ප්‍රකාශයේ අනාවරණය කර ඇත | මූල්‍ය ප්‍රකාශන අත්සන් කිරීමට පෙර ගණකාධිකාරීවරයා SLPSAS සමඟ අනුකූල වන බවට සහතික විය යුතුය. |
| (ඈ) | ඉඩම් අංශය විසින් විගණනයට ඉදිරිපත් කරන ලද සවිස්තරාත්මක තොරතුරුවලට අනුව 2023 දෙසැම්බර් 31 දිනට ඉඩම් අත්පත් කර ගැනීම සඳහා ගෙවිය යුතු පොලිය රුපියල් මිලියන 190.09 ක් ලෙස ගණන් බලා ඇත. 2023 දෙසැම්බර් 31 දිනට ඉඩම් අත්පත් කර ගැනීම සඳහා ගෙවිය යුතු පොලිය රුපියල් මිලියන 282.16 කි. එබැවින් එම මුදල් අතර රුපියල් මිලියන 92.07 ක වෙනසක් දක්නට ලැබිණි. | 92.07 | එකඟ වේ.<br>අප දැනටමත් යවා ඇති කාලසටහනේ අංක ගණිත දෝෂයක් ඇති බව දැනගත් බැවින් නිවැරදි කළ කාලසටහන අමුණා ඇත. | මූල්‍ය ප්‍රකාශන අත්සන් කිරීමට පෙර ගණකාධිකාරීවරයා නිරවද්‍යතාවය පිළිබඳ සහතික විය යුතුය. |

**2.2 නොපියවූ ශේෂයන්**

| අංකය | විස්තරය | මුදල රු. මිලියන | නොපියවූ කාලසීමාව | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|---|
| | 2023 දෙසැම්බර් 31 දිනට වසර හතරට වැඩි කාලයක් තුළ වෙළඳ දැන්වීම්, මැනුම් කටයුතු, නායයෑම් අධ්‍යයනය, පදික වේදිකාව සැලසුම් කිරීම සහ පාරිසරික උපදේශන වියදම් සඳහා ලැබිය යුතු රුපියල් මිලියන 16.96ක ශේෂ 02 ක් අයකර ගැනීමට ව්‍යාපෘතිය කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | 16.96 | වසර 4ට වැඩි | එකඟ වේ. I/C/A OFID – IV මගින් පියවීමට කටයුතු කර ඇති අතර, දැනට රුපියල් මිලියන 16.96න් රුපියල් මිලියන 6.0ක් අයකරගෙන ඇත. ඉතිරිය 2024 අවසන් වන විට පියවනු ඇත. | ගෙවිය යුතු මුදල පියවීමට කඩිනම් පියවර ගත යුතුය. |

**3. භෞතික කාර්ය සාධනය**

**3.1 ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය**

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ව්‍යාපෘති ක්‍රියාකාරිත්වයේ ප්‍රතිඵල මැනීමට KPI ස්ථාපිත කර නොතිබුණි. එබැවින්, ව්‍යාපෘතියෙන් මහජනතාවට ලැබෙන ප්‍රතිලාභ මට්ටම විගණනයේදී සත්‍යාපනය කළ නොහැකි විය. | එකඟ වේ<br>අධීක්ෂණය සඳහා KPI පිහිටුවීමේ වැදගත්කම අවබෝධ කරගත් අතර, ව්‍යාපෘති ප්‍රතිලාභ නිරීක්ෂණය කිරීම සඳහා KPI පිහිටුවීමට ව්‍යාපෘති කළමනාකරණ ඒකකය වෙත දැනුම් දෙන ලදී. තවද, මාර්ගය නඩත්තු කරන RDA හරහා ප්‍රතිලාභ නිරීක්ෂණය කිරීම අවශ්‍ය වේ. | ව්‍යාපෘතිය ආරම්භ කිරීමට පෙර ව්‍යාපෘති අධ්‍යක්ෂ KPI හඳුනාගත යුතුය. |
| (ආ) | ජාතික මාර්ග 04 න් කිලෝමීටර් 25.8 ක ප්‍රතිසංස්කරණ කටයුතු කොන්ත්‍රාත් පැකේජ 02 ක් යටතේ සිදුකිරීමට නියමිතව තිබුණි. 2015 ජූනි 26 වැනි දින ණය ගිවිසුම අත්සන් කළද ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලියේ ප්‍රමාදය හේතුවෙන් කොන්ත්‍රාත් පැකේජ 02ක පුනරුත්ථාපන කටයුතු වසර 2 ½ කට පසුව ආරම්භ කර තිබූ අතර ව්‍යාපෘති පිරිවැය රුපියල් මිලියන 645 කින් ඉක්මවා තිබුණි. කඩුවෙල සිට අතුරුගිරිය මාර්ගයේ ඉතිරි වැඩ නිම නොකර ඉතිරි ණය මුදලින් මුල් වැඩ විෂය පථයට අයත් නොවන ඔරුගොඩවත්ත - අඹතලේ මාර්ගයේ අංක 9/1 පාලම ප්‍රතිසංස්කරණය කිරීමට ව්‍යාපෘතිය දැනටමත් ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කර ඇත. තවද, කොන්ත්‍රාත් පැකේජය I යටතේ වල්ගම-අතුරුගිරිය මාර්ගයේ කිලෝමීටර් 1.25 ක් ප්‍රතිසංස්කරණය කිරීමේ කටයුතු ඉඩම් | එකඟ වේ<br>2018.01.29 සහ 2017.10.05 යන දිනවල පිළිවෙළින් I පැකේජය සහ II පැකේජය සඳහා ඉදිකිරීම් ආරම්භ කරන ලදී.<br>ඉතිරි ණය මුදල ඔරුගොඩවත්ත - අඹතලේ පාරේ අංක 9/1 පාලම වැඩිදියුණු කිරීම සඳහා යෙදවීමට තීරණය කර ඇත. | ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් ව්‍යාපෘතියේ මූලික විෂය පථය සම්පූර්ණ කිරීම පිළිබඳව සහතික විය යුතුය. |

අත්පත් කර ගැනීමේ ක්‍රියාවලියේ ගැටළු හේතුවෙන් ව්‍යාපෘතියේ විෂය පථයෙන් ඉවත් කර තිබුණි.

### 3.2 නීති, රීති සහ රෙගුලාසි වලට අනුකූල නොවීම

| | නීති රීති සහ රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශවල අංක 8.13.4 වගන්තිය | ප්‍රමාණ බිල්පත් සැකසීමට සම්බන්ධ සියලුම වෘත්තිකයන් BOQ හි ඇතුළත් කර ඇති ප්‍රමාණයන් හැකිතාක් නිවැරදි බව සහතික කළ යුතු අතර ප්රමාණය අඩු කිරීමට සියයට 5 කට වඩා වැඩි ප්‍රමාණයකට ඉඩ නොදිය යුතුය. කෙසේ වෙතත්, ආරම්භක අදියරේදී BOQ හි ඇති මුළු ප්‍රමාණයන් හඳුනා ගැනීමට ව්‍යාපෘතියට නොහැකි වී තිබුණි. එබැවින්, ව්‍යාපෘතිය පසුව B 174 කඩුවෙල - අතුරුගිරිය මාර්ගය සඳහා විචල්‍ය නියෝග නිකුත් කර ඇත. මෙම ව්‍යාපෘතිය කොන්ත්‍රාත්තුවේ මුළු පිරිවැයෙන් සියයට 43ක් නියෝජනය කරමින් රුපියල් මිලියන 453ක් දක්වා විචල්‍ය නියෝග නිකුත් කර තිබුණි . | ආරම්භක BOQ සහ සංශෝධිත BOQ අතර වෙනස රුපියල් මිලියන 453 (රු. මිලියන 1,518 - 1,065) වේ. කෙසේ වෙතත්, නිකුත් කර ඇත්තේ රුපියල් මිලියන 45.8 ක විචලන නියෝග 53 ක් පමණි. තවත් හේතු කිහිපයක් නිසා ව්‍යාපෘති පිරිවැය සැලකිය යුතු ලෙස වැඩි වී ඇත. පළමුව, බිල් අංක 01 හි විශේෂයෙන් පෙන්වා දී ඇති ව්‍යාපෘතියේ දිගු කාලසීමාව, වියදම් මිලියන 72.3 ඉහළ යාමට හේතු වී ඇත. තවද, ආර්ථික අර්බුදය හේතුවෙන් සැලකිය යුතු මිල වැඩිවීම් (රු. මිලියන 119.5) ව්‍යාපෘතියට බලපා ඇත. මීට අමතරව, ලබා දී ඇති දින දීර්ඝ කිරීම හේතුවෙන් පිරිවැය හිමිකම් (රු. මිලියන 239) ඉහළ ගොස් ඇත. | විචල්‍ය ඇණවුම් නිර්දේශ කිරීමට පෙර ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටිය අනුගමනය කිරීමට ව්‍යාපෘති කළමනාකරණ ඒකකය කටයුතු කළ යුතුය. |
| (ආ) | ප්‍රසම්පාදන අත්පොතෙහි 14 අතිරේකය | ව්‍යාපෘතියේ ඉංජිනේරු ඇස්තමේන්තුවේ ඇති අයිතම සහ අංක 55 අතුරු ගෙවීම් සහතිකය යටතේ ඇති අයිතම සංසන්දනය කිරීමේදී රුපියල් මිලියන 247 ක් වටිනා වැඩ අයිතම 43 ක් පමණ සම්පූර්ණයෙන් ඉවත් කර ඇති බව හඳුනාගත හැකිය. ඊට අමතරව රුපියල් මිලියන 27ක් වටිනා වැඩ අයිතම 26ක් අනුමත BOQ ප්‍රමාණ සීමාව ඉක්මවන ඒවා ලෙස හඳුනාගත හැකිය. එහි ප්‍රතිඵලයක් ලෙස ව්‍යාපෘතියේ සම්පූර්ණ පිරිවැය ඇස්තමේන්තුව නිරවද්‍ය ලෙස සකස් කර නොතිබුණි. | සමහර අයිතම BOQ ප්‍රමාණය ඉක්මවා ඇත. සාමාන්‍යයෙන්, ඉංජිනේරු ඇස්තමේන්තු සකස් කරනු ලැබුවේ පෙර අත්දැකීම් සහ මාර්ගයේ දෘශ්‍ය නිරීක්ෂණ පදනම් කරගෙන ය. ආරම්භක අදියරේදී අනපේක්ෂිත හේතු නිසා අයිතමවල සමහර ප්‍රමාණයන් වෙනස් විය හැක. | ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් BOQ අනුමත කිරීමට පෙර අවශ්‍ය BOQ අයිතම සහ සාධාරණ BOQ ගාස්තු සම්පූර්ණ බව සහතික කළ යුතුය. |

### 3.3 කොන්ත්‍රාත් පරිපාලනය

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | ව්‍යාපෘතියේ ණය ගිවිසුම 2015 ජූනි 26 වැනි දින ඇමෙරිකානු ඩොලර් මිලියන 17කට අත්සන් කරන ලද අතර 2019 ජූනි 30 වැනි දින අවසන් කිරීමට නියමිතව තිබුණි. කෙසේ වෙතත්, ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු ප්‍රමාද වීම හේතුවෙන්, අරමුදල් නියෝජිතායතනය විසින් ණය අවසන් දිනය 2026 මැයි 10 දක්වා කිහිප වතාවක් දීර්ඝ කර තිබුණි. ණය ආපසු ගෙවීම 2020 දී ආරම්භ කර තිබුණද, 2023 දෙසැම්බර් 31 වන විට මුළු ණය පහසුකම්වලින් සියයට 13 ක් නියෝජනය කරමින් ඇමරිකානු ඩොලර් මිලියන 2.28 ක් ව්‍යාපෘතියට භාවිතා කිරීමට නොහැකි වී තිබුණි. | එකඟ වේ.<br>ඉඩම් අත්පත් කර ගැනීමේ ප්‍රමාදය හේතුවෙන් ව්‍යාපෘතිය ප්‍රමාද විය. කෙසේ වෙතත්, ඉතිරි ණය ප්‍රතිපාදන ඕරුගොඩවත්ත - අඹතලේ පාරේ අංක 9/1 පාලම ප්‍රතිසංස්කරණය කිරීමට යොදා ගැනීමට තීරණය කර ඇත. | ව්‍යාපෘති අධ්‍යක්ෂවරයා ව්‍යාපෘතියේ විෂය පථයට අනුකූල විය යුතුය. |
| (ආ) | ව්‍යාපෘතියේ උපදේශන ගිවිසුම 2018 මාර්තු 08 දින රුපියල් මිලියන 147.79 කට ආරම්භ කරන ලද අතර අවසන් දිනය 2019 ජූලි 28 විය. කෙසේ වෙතත්, ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු ප්‍රමාද වීම හේතුවෙන් උපදේශන ගාස්තුව රුපියල් මිලියන 299.36 දක්වා සංශෝධනය කර ඇති අතර අවසන් කිරීමේ දිනය 2023 ජනවාරි 31 දක්වා කිහිප වතාවක් දීර්ඝ කර ඇත. ව්‍යාපෘතිය නිම කිරීම ප්‍රමාද වීම හේතුවෙන් උපදේශන කොන්ත්‍රාත්තුවේ මුළු පිරිවැයෙන් සියයට 102.57 ක් නියෝජනය කරමින් රුපියල් මිලියන 151.59 ක් ගෙවා තිබුණි. තවද, කොන්ත්‍රාත්කරුගේ දුර්වල ක්‍රියාකාරිත්වය ව්‍යාපෘති පිරිවැය ඉක්මවා යාමට අහිතකර ලෙස බලපා ඇති බව නිරීක්ෂණය විය. | C (iv) අයිතමයේ සඳහන් කර ඇති පරිදි, වැඩබිම අත්කරගැනීමේ ප්‍රමාදය හේතුවෙන් කොන්ත්‍රාත් කාලය දීර්ඝ කරන ලදී.<br><br>ඒ අනුව, අවම පිරිවැය ඉදිකිරීම් අධීක්ෂණය සඳහා උපදේශන සේවා ද දීර්ඝ කරන ලදී. | ව්‍යාපෘති අධ්‍යක්ෂවරයා විසින් ව්‍යාපෘතියේ අනවශ්‍ය ප්‍රමාදය සහ පිරිවැය ඉක්මවා යාම වැළැක්වීමට සහතික විය යුතුය |
| (ඇ) | කඩුවෙල - අතුරුගිරිය මාර්ගයේ කිලෝමීටර් 9.5 ක ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා කොන්ත්‍රාත්කරු 2018 ජනවාරි 29 වන දින රුපියල් මිලියන 1,065 ක වියදමින් ආරම්භ කර 2019 ජූලි 28 දින නිම කිරීමට නියමිතව තිබුණි. කෙසේ වෙතත්, කොන්ත්‍රාත්කරුට දින 841 ක කාලය දීර්ඝ කිරීම මගින් ව්‍යාපෘතියේ කොන්ත්‍රාත් කාලය 2023 අගෝස්තු 29 දක්වා දීර්ඝ කර ඇත. තවද, කොන්ත්‍රාත්කරු විසින් දින 841ක කාලය දීර්ඝ කිරීමේ පිරිවැයට අදාළව රුපියල් මිලියන 311ක් ඉල්ලා ඇති බවත්, කොන්ත්‍රාත්කරුගේ දුර්වල ක්‍රියාකාරිත්වය | එකඟ නොවේ.<br><br>ඉඩම් අත්පත් කර ගැනීමේ ප්‍රමාදයන් හේතුවෙන් කොන්ත්‍රාත්තුව ප්‍රධාන වශයෙන් ප්‍රමාද විය. තවද, උපයෝගිතා මාරුවීම් ප්‍රමාදයන් ද ප්‍රමාදයට සැලකිය යුතු ලෙස දායක විය.<br><br>ඉංජිනේරුවරයාගේ ඇගයීමට අනුව, කොන්ත්‍රාත්කරුට වැඩබිම අත්පත්කරගැනීම ප්‍රමාද වීම හේතුවෙන්<br><br>ගෙවීම් ඉල්ලුම් කිරීමට හිමිකම් ඇත. | කොන්ත්‍රාත්තුවේ කොන්දේසි අනුව කාලය දීර්ඝ කිරීම, නිර්දේශ කිරීමට පෙර හේතුවල නිරවද්‍යතාවය සහ මිල වැඩිකිරීමේ අදාළත්වය ඉංජිනේරුවරයා තහවුරු කරගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | සැලකිල්ලට නොගෙන ව්‍යාපෘතිය විසින් එම හිමිකම් පෑම අනුමත කර ඇති බවත් නිරීක්ෂණය විය. එය විගණනයේදී ගැටලු සහගත විය. | | |
| (ඇ) | OFID-3/1 පැකේජයට අදාළ කොන්ත්‍රාත්කරුගේ අතුරු ගෙවීම් සහතික නිකුත් කර ගෙවීම් සඳහා ඉදිරිපත් කළද, ව්‍යාපෘතිය විසින් මෙම ගෙවීම් ප්‍රමාදයකින් පියවා ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස ප්‍රමාද වූ කාලය සඳහා කොන්ත්‍රාත්කරු රුපියල් මිලියන 18ක පොලියක් ඉල්ලා ඇත. කොන්ත්‍රාත්කරුගේ ගෙවීම් පියවීමේ ප්‍රමාදය ව්‍යාපෘති පිරිවැය ඉක්මවා යාමට බලපා ඇති බව නිරීක්ෂණය විය. | එකඟ වේ.<br>DAB විසින් දීර්ඝ කිරීමේ පිරිවැය ගෙවීමට නිර්දේශ කරන ලද අතර, එය ගෙවීමට ප්‍රමාණවත් ප්‍රතිපාදනයක් නොතිබූ අතර, BOQ හි සංශෝධනයක් සහ ගෙවීම් පියවීම සඳහා අමතර ප්‍රතිපාදන සඳහා ඉල්ලීමක් කළ අතර, එය අමතර කාලය සහ පිරිවැයට හේතු විය. ඒ අනුව, ගෙවීම් ප්‍රමාදයක් සිදු වූ අතර, කොන්ත්‍රාත්කරු විසින් කොන්ත්‍රාත්තුවේ සාමාන්‍ය කොන්දේසි 14.8 වගන්තිය අනුව ප්‍රමාද ගෙවීම් ගාස්තු ඉල්ලා තිබුණි. | පාඩු අවම කිරීමට ව්‍යාපෘති කළමනාකරණ ඒකකය අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඉ) | කොන්ත්‍රාත්තුවේ පිරිවිතරවල 128 සහ 129 උප වගන්තියට අනුව පවරා ගැනීමේ සහතිකය නිකුත් කරන දිනයේ දී රසායනාගාර උපකරණ සහ ගෘහ භාණ්ඩ කොන්ත්‍රාත්කරු වෙත ආපසු ලබා දිය යුතු අතර කොන්ත්‍රාත්තුව අවසානයේ මැනුම් උපකරණ කොන්ත්‍රාත්කරු වෙත ආපසු ලබා දිය යුතුය. කෙසේ වෙතත්, ව්‍යාපෘතිය 2023 දෙසැම්බර් 31 දිනට ක්ෂේත්‍ර රසායනාගාර උපකරණ සහ මිනුම් උපකරණ සඳහා එකවර රුපියල් මිලියන 18.5 ක මුදලක් ගෙවා තිබුණි. අවාසිදායක කොන්ත්‍රාත් තත්ත්වයන් කොන්ත්‍රාත්කරුවන්ට අමතර ප්‍රතිලාභ ගෙන දිය හැකි බව නිරීක්ෂණය විය. | එකඟ වේ.<br>මාර්ග සංවර්ධන අධිකාරියේ (RDA) පවතින රසායනාගාර සහ මිනින්දෝරු උපකරණ අවශ්‍යතා ඉක්මවා යන අතර, ව්‍යාපෘති නිගමනය මගින් නව උපකරණ ලබා ගැනීම අනවශ්‍ය වේ. එබැවින්, 128 සහ 129 වගන්තියේ විශේෂිත පිරිවිතර (සේවා යෝජකයාගේ අවශ්‍යතාවය) සේවා යෝජකයාගේ අපේක්ෂාවන්ට අනුකූල වීම සඳහා කොන්ත්‍රාත්තුවට ඇතුළත් කර ඇත. තවද, තරඟකාරී ස්වභාවයකින් ලංසු කැඳවන බැවින් මේ හේතුවෙන් ලංසු මිල අඩු වූ බව උපකල්පනය කළ හැකිය. | ලංසු ලේඛන ඇගයීමේදී මෙම කරුණු සලකා බැලීම සඳහා ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් TEC වෙත දැනුම් දිය යුතුය. |
| (ඊ) | කොන්ත්‍රාත්තුවේ සාමාන්‍ය කොන්දේසි වල අංක 42 වගන්තියට අනුව (FIDIC - 1999) කොන්ත්‍රාත්කරු තමාගේම වියදමින් කාර්ය සාධන ආරක්ෂාව ලබා ගත යුතුය. කෙසේ වෙතත්, කාර්ය සාධන ආරක්ෂණ පිරිවැය සඳහා ව්‍යාපෘතියෙන් රුපියල් මිලියන 11.79 ක මුදලක් ගෙවා තිබුණි. තවද ව්‍යාපෘතිය විසින් BOQ මුදල වූ රුපියල් මිලියන 5.67 ඉක්මවා රුපියල් මිලියන 6.13 ක් කොන්ත්‍රාත්කරු වෙත ගෙවා ඇති බව නිරීක්ෂණය විය. | එකඟ නොවේ.<br>කොන්ත්‍රාත්තුවේ කොන්දේසි (COC) හි 4.2 වගන්තියට අනුව, ටෙන්ඩරයේ උපග්‍රන්ථයේ ප්‍රමාණය සහ මුදල් ප්‍රකාශ කර ඇත්නම්, කොන්ත්‍රාත්කරු තම වියදමින් කාර්ය සාධන ආරක්ෂාවක් ලබා ගත යුතු බව පැහැදිලිව දක්වා ඇත. ඉහත සඳහන් කළ කොන්දේසියට පටහැනිව, ටෙන්ඩර් ලේඛනවල ටෙන්ඩරයේ උපග්‍රන්ථයේ මුදල සඳහන් කර නොමැත. | ලංසු ලේඛන ඇගයීමේදී මෙම කරුණු සලකා බැලීම සඳහා ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් TEC වෙත දැනුම් දිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (උ) | වැඩබිම අත්කරගැනීමේ ප්‍රමාදය හේතුවෙන් RDA/MFAP/ICB/OFID-03/02 පැකේජය සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් දින 431ක් සඳහා කාලය දීර්ඝ කිරීම අනුමත කර ඇත. ඒ අනුව දීර්ඝ කිරීම සහ මූලික පොදු පිරිවැය සඳහා ව්‍යාපෘතිය මගින් රුපියල් මිලියන 268ක මුදලක් ගෙවා තිබුණි. එබැවින් ව්‍යාපෘති වියදම රුපියල් මිලියන 268කින් වැඩි වී ඇති බව නිරීක්ෂණය විය. | එකඟ වේ.<br>කොන්ත්‍රාත්තුවේ දක්වා ඇති පරිදි වැඩබිම අත්කරගැනීමේ ප්‍රමාදය හේතුවෙන්, කොන්ත්‍රාත්කරුට දීර්ඝ කිරීමේ පිරිවැයට හිමිකම් ඇත. | ඉදිකිරීම් ආරම්භ කිරීමට පෙර යටිතල පහසුකම් සංවර්ධනය කිරීමට ව්‍යාපෘති කළමනාකරණ ඒකකය පියවර ගත යුතුය. |
| (ඌ) | බස්නාහිර පළාතේ තෝරාගත් ජාතික මහාමාර්ග කිලෝමීටර 27 ක් ප්‍රතිසංස්කරණය , වැඩිදියුණු කිරීම සහ පුළුල් කිරීම ව්‍යාපෘතියේ අරමුණයි. කොන්ත්‍රාත් ගිවිසුමට අනුව, B174 කඩුවෙල - අතුරුගිරිය මාර්ග කොටස කිලෝමීටර් 0+000 සිට 9+500 දක්වා වැඩි දියුණු කිරීම සහ ප්‍රතිසංස්කරණය කිරීම සඳහා කොන්ත්‍රාත් ලබා දී ඇත. කිලෝමීටර් 0+000 සිට 9+000 දක්වා කොටස 2023 මාර්තු 13 දින සේවායෝජකයා විසින් පවරාගෙන ඇත. කෙසේ වෙතත්, 9+000 සිට 9+500 දක්වා කොටස අතහැර දමා ඇති බවත්, වෙලේ හන්දිය සහ අතුරුගිරිය හන්දිය ව්‍යාපෘතිය මගින් අවසන් කර නොමැති බවත් නිරීක්ෂණය විය. මේ නිසා ව්‍යාපෘතියේ අරමුණු ඉටු වී නොතිබුණි | එකඟ වේ.<br>කඩුවෙල - අතුරුගිරිය මාර්ගයේ අවසන් මීටර් 500 (කිලෝමීටර් 9+000 –9+500) මාර්ග කොටස අතුරුගිරිය හන්දියේ ඉඩම් අත්පත් කර ගැනීමේ ප්‍රමාදය හේතුවෙන් ආරම්භ කර නොමැත.<br><br>1992 දී අතුරුගිරිය හන්දිය වැඩිදියුණු කිරීම සඳහා ඉඩම ලබා ගත් අතර, ඒ සඳහා වන්දි ගෙවා නැත. කඩුවෙල - අතුරුගිරිය මාර්ගය (වර්තමානය) සඳහා LAQ වැඩ ආරම්භ කිරීමේදී මෙම තත්ත්වය අවබෝධ විය. ඉඩම් හිමියෝ ඊට විරෝධය පළ කළ අතර මුල් අත්පත් කර ගැනීමේ මුදල ගෙවන තුරු ඉඩම ලබා දීමට එකඟ නොවීය. | ව්‍යාපෘති කළමනාකරණ ඒකකය ව්‍යාපෘතියේ විෂය පථය අනුව ව්‍යාපෘතිය සම්පූර්ණ කළ යුතුය |
| (එ) | ඉංජිනේරු ඇස්තමේන්තුව සහ කොන්ත්‍රාත් ගිවිසුමට අනුව ටොන් 7169 ඇස්ෆල්ට් කොන්ක්‍රීට් wearing course සඳහා ඇස්තමේන්තු කර තිබුණි. කෙසේ වෙතත්, ව්‍යාපෘතිය අවසානයේ ටොන් 4,847.56 ක ඇස්ෆල්ට් කොන්ක්‍රීට් භාවිතා කර ඇති අතර, තවත් කිලෝමීටර් 0+000 සිට 1+600 දක්වා කොටස කොන්ක්‍රීට් කර නොතිබුණි. ඒ හේතුවෙන් 2024 මැයි 08 දින සිදුකළ ස්ථානීය පරික්ෂාවේදී යම් යම් සීරීම් සහ හානි නිරීක්ෂණය විය | එකඟ වේ.<br>කොන්ත්‍රාත්කරු කිලෝමීටර් 0+ 000 සිට 1+600 දක්වා තාර කොන්ක්‍රීට් නිම කිරීමට සැලසුම් කර ඇතත් පවතින පයිප්පවලින් ජලය කාන්දු වීම නිසා වැඩ ප්‍රමාද විය. කෙසේ වෙතත්, පවතින නල මාරු කිරීමෙන් පසු ද්‍රව්‍ය හිඟයක් හේතුවෙන් මාර්ග කොන්ත්‍රාත්කරු තාර දැමීම ආරම්භ කළේ නැත. මෙම මාර්ග කොටස වසර 6 කට පමණ පෙර නිම කරන ලද අතර, කිසිදු මූලික දෝෂයක් නිරීක්ෂණය නොවීය. wearing course යෙදීමෙන් මතුපිට නිවැරදි කිරීම සිදු කළ හැකිය. | පාඩු සහ හානි අවම කිරීමට ව්‍යාපෘති කළමනාකරණ ඒකකය අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඒ) | නැවත ස්ථානගත කිරීමේ කටයුතු සම්බන්ධීකරණය සඳහා කොන්ත්‍රාත්කරු වගකිව යුතු වුවද, ලංකා විදුලිබල මණ්ඩලයේ (CEB) සහ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ උපයෝගිතා නැවත | එකඟ වේ.<br>ඉඩම් අත්පත් කර ගන්නා තෙක් උපයෝගිතා සමඟ පූර්ව සූදානමක් කළ නොහැකිය. සාමාන්‍යයෙන්, විදුලිබල මණ්ඩලය එකවර කණු 10-12ක් මාරු | ව්‍යාපෘති කළමනාකරණ ඒකකය යටිතල පහසුකම් ක්‍රියාකාරකම් කලින් සකස් කළ යුතුය |

| | | | |
|---|---|---|---|
| | ස්ථානගත කිරීමේ ප්‍රමාදයන් ඇති වී තිබුණි. උපයෝගිතා නැවත ස්ථානගත කිරීම සඳහා තවදුරටත් පූර්ව සූදානමක් සිදු කර නොතිබූ අතර, තාර කොන්ක්‍රීට් මත කොන්ත්‍රාත්කරු විසින් අලුත්වැඩියා කටයුතු කිහිපයක් සිදු කර ඇත. තවද කඩුවෙල අතුරුගිරිය පාරේ විදුලි කණු නැවත ස්ථානගත කිරීම සඳහා ලංකා විදුලිබල මණ්ඩලයට BOQ මුදල වන රුපියල් මිලියන 46 කට වඩා රුපියල් මිලියන 106ක් ව්‍යාපෘතිය විසින් ගෙවා තිබීම විගණනයේදී ගැටළුකාරී විය. | කරන ලෙස ඉල්ලා සිටින අතර එහිදී තනි ගොඩනැගිල්ලක් තිබේ නම් මාරු කිරීම ආරම්භ නොවේ. එබැවින්, ලංවීම රේඛා වල යටින් ඇති සියලුම ගොඩනැගිලි ඉවත් කිරීම අවශ්‍ය වේ.<br><br>ලංසු තැබීමේ අදියරේදී, PS අයිතමය යටතේ ඇති මුදල සපයනු ලබන්නේ තවත් සමාන ව්‍යාපෘතියක් සමඟ සම්බන්ධ වන පිරිවැය සලකා බැලීමෙනි. එබැවින්, මාර්ග වැඩ ආරම්භ කිරීමෙන් පසු උපයෝගිතා ආයතනවලින් (විශේෂයෙන් ලංවීම) කණු මාරු කිරීම සඳහා කැඳවීමේදී පිරිවැය වෙනසක් ඇත. | |

## 3.4 ඉඩම් අත්පත් කර ගැනීම පිළිබඳ ගැටලු

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | ලැබී ඇති තොරතුරුවලට අනුව, ව්‍යාපෘති කටයුතු සඳහා රජයේ ඉඩම් කට්ටි 504ක් ඇතුළුව ඉඩම් කට්ටි 2,747 ක් අත්පත් කර ගැනීමට නියමිතව තිබූ අතර ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 17 වන වගන්තිය යටතේ රුපියල් මිලියන 1,564 ක වන්දි මුදල් ව්‍යාපෘතිය මගින් ගෙවා තිබුණි. ඊට අමතරව 2023 දෙසැම්බර් 31 දින දක්වා වන්දි ගෙවීම ප්‍රමාද වීම මත පොලී වශයෙන් රුපියල් මිලියන 416.55 ක් ගෙවා තිබුණි. කෙසේ වෙතත්, 2023 දෙසැම්බර් 31 දිනට ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 44 වැනි වගන්තිය යටතේ ඉඩම් කට්ටි 411 ක් පමණක් ලියාපදිංචි කර තිබුණි. | එකඟ වේ.<br>ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 44 වැනි වගන්තිය යටතේ අත්පත් කරගත් ඉඩම් ලියාපදිංචි කිරීම අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාල (DSS) විසින් සිදු කරනු ලැබේ. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ලියාපදිංචි කිරීමේ ප්‍රමාදයක් ඇති අතර එය සම්පූර්ණ කිරීම සඳහා සිහි කැඳවීම් කිහිපයක් යවා ඇත.<br>කෙසේ වෙතත්, 17 වගන්තිය යටතේ වන්දි ගෙවීමෙන් පසු, ඉදිකිරීම් කටයුතු සඳහා කිසිදු බාධාවක් නොමැති අතර, එම 44 වන වගන්තියේ ලියාපදිංචිය ව්‍යාපෘති ප්‍රගතියට බලපාන්නේ නැත. | ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය නිසි ක්‍රියාකාරී සැලැස්මක් සහිතව සිදු කළ යුතුය. |
| (ආ) | ප්‍රගති වාර්තාවට අනුව මාර්ගවල සමස්ත භෞතික ප්‍රගතිය සියයට 100ක් ලෙස දක්වා තිබුණද, 2023 දෙසැම්බර් 31 වන විට ව්‍යාපෘතියේ ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතුවලින් සියයට 83ක් පමණක් අවසන් කර තිබුණි. | එකඟ වේ.<br>ඉඩම් අත්පත් කර ගැනීමේ ප්‍රගතිය ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 44 වැනි වගන්තිය සම්පූර්ණ කිරීමෙන් පසු සියයට 100 දක්වා ළඟා වේ. ඉඩම් අත්පත් කර ගැනීමේ 17 වැනි වගන්තිය අනුව වන්දි ගෙවීමෙන් පසු ව්‍යාපෘති ක්‍රියාකාරකම් සම්පූර්ණ කළ හැක. කෙසේ වෙතත්, ව්‍යාපෘති අංශය හරහා 44 වන වගන්තිය සම්පූර්ණ කිරීමට උපරිම උත්සාහයක් ගනු ඇත | ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය නිසි ක්‍රියාකාරී සැලැස්මක් සහිතව සිදු කළ යුතුය. |